*සැ. යු.* - 2012.07.27 වැනි දින පළ වූ අංක 1769 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,770 - 2012 අගෝස්තු මස 03 වැනි සිකුරාදා - 2012.08.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1140 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1141 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1144 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1152 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගෝස්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා අධිකරණය - ගම්පොල

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ, අංක සොයාගත නොහැකි හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මෙම අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ, අධිකරණ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ දී ඉවත් කරන ලද උපකරණ, භාණ්ඩ වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද කාර්යාල උපකරණ, පැරණි දිසා විනිසුරු නිල නිවසින් ගලවා ඉවත් කර ඇති භාණ්ඩ සහ නඩු අංක සොයාගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2012.09.09 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 9.00 ට පෙර හිමිකම් තහවුරු කළ යුතුයි.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.00 සිට 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල්වලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිල දී ගන්නා සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිළදී ගන්නා සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ඒ. එම්. ඒ. වසන්ත කුමාර,
දිසා විනිසුරු.

2012 ජූලි මස 10 වැනි දින,
ගම්පොල දිසා අධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 17859 | පොරෝ | 01යි |
| 02. | 70667 | කුඩා ළමුන්ගේ ඇඳුම් තොගයක් | |
| 03. | 71064 | සවල් | 01යි |
| 04. | 63367 | සවල් | 01යි |
| 05. | 65448 | සවල් | 01යි |
| 06. | 55655 | සවල් | 01යි |
| 07. | 75573 | සවල් | 01යි |
| 08. | 74094 | සවල් | 01යි |
| 09. | 65426 | තාච්චි | 01යි |
| 10. | 65435 | තාච්චි | 01යි |
| 11. | 39091 | තාච්චි | 01යි |
| 12. | 75835 | සිංතා වර්ගයේ පැදුරු | 01යි |
| 13. | 67892 | (i) යකඩ බට කෑබලි | 01යි |
| | | (ii) දුනු කෑබලි | 01යි |
| | | (iii) උදලු තල | 01යි |
| 14. | 74606 | ඉමිටේෂන් වළලු ජෝඩු | 01යි |
| 15. | 74563 | මේස් ජෝඩු අඩංගු උර | 01යි |
| 16. | 72913 | ස්ටේප්ලර් | 01යි |
| 17. | 73903 | ටී සොකට් | 01යි |
| 18. | අංක රහිත | පොරෝ | 04යි |
| 19. | 65856 | තහඩු බාල්දි | 01යි |
| 20. | 65216 | තහඩු බාල්දි | 01යි |
| 21. | 65218 | තහඩු බාල්දි | 01යි |
| 22. | 72512 | ඇලුමිනියම් පෝච්චි | 01යි |
| 23. | 73113 | ඇණ පැකට් | 01යි |
| 24. | 73536 | ඇල්ෆාටෙල් වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 25. | 66029 | කම්බි රාක්ක | 01යි |
| 26. | 46080 | ඇලුමිනියම් මුට්ටි | 01යි |
| 27. | 77109 | ලීටර් 4 ප්‍රමාණයේ තීන්ත ටින් | 01යි |
| 28. | AR 4495 | DT 125 දරන යතුරු පැදිය (අමතර කොටස් සඳහා) | |
| 29. | AR 4953 | සුසුකි 90 වර්ගයේ යතුරු පැදිය (අමතර කොටස් සඳහා) | |
| 30. | AR 2521/9 | CF 90 ඩයිඩෝ වර්ගයේ යතුරු පැදිය ( HW 2662) | |
| 31. | 73613 | කාන්තා වළලු ඇසුරුම් | 01යි |
| 32. | 75835 | පැදුරු | 01යි |
| 33. | 77801 | ලන්ච් ෂීට් පාර්සල් | 01යි |
| 34. | අංක රහිත | වැලි ගොඩ දමන අත් බැකෝ | 02යි |
| 35. | - | කැඩුණු යකඩ ගේට්ටුවක කොටස් | |
| 36. | අංක රහිත | යකඩ බට | 03යි |
| 37. | - | යකඩ කෑබලි තොගයක් | |
| 38. | - | යකඩ තරප්පුවක් | |
| 39. | - | ඇලුමිනියම් පෙට්ටි | 01යි |
| 40. | - | අත් පොරෝ | 02යි |
| 41. | - | රවුම් කියත් තල | 02යි |
| 42. | - | වක්පිහි | 03යි |
| 43. | - | කැති | 02යි |
| 44. | - | කුඩා පිහි | 10යි |
| 45. | - | ලී යතු කැටය සහ අත් කියත් | 01යි |
| 46. | - | ඇලුමිනියම් සෙම්බු | 01යි |
| 47. | - | වාහනයක ජැක් | 01යි |
| 48. | - | යකඩ බාල්දි | 01යි |
| 49. | - | හරස් කියත් | 01යි |
| 50. | 77326 | (i) පිහි | 24යි |
| | | (ii) ටෙස්ටර් | 04යි |
| | | (iii) හිරමනා තල | 05යි |
| 51. | අංක රහිත | යකඩ ගේට්ටු පියන් | 02යි |
| 52. | - | සිවිලින් ෆෑන් | 13යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 53. | - | ටියුබ් ලයිට් හෝල්ඩර්ස් | 30යි |
| 54. | - | ස්විච් බෝඩ් කොටස් සමග වයර් තොගයක් | |
| | - | | |
| 55. | | පාවිච්චි කරන ලද නාන කාමරයක උපාංග | |
| 56. | - | විශ්කම්භය අගල් 3ක් හා දිග අඩි 15ක් වන යකඩ බටයක් | |
| 57. | - | දිරාගිය තහඩු වැහිපිහිලි තොගයක් හා බට කිහිපයක් | |
| 58. | - | යකඩ දැල් කැබලි තොගයක් | |
| 59. | - | ප්ලාස්ටික් වැහිපිහිලි සහ බට කිහිපයක් | |
| 60. | - | ලී මේස (මේස ලැල්ල රහිත) | 01යි |
| 61. | - | දිග ඇඳි සහිත බංකු | 04යි |
| 62. | - | භාවිතයට ගත නොහැකි ලී පුටු (ඇඳි සහිත) | 19යි |

08-36

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මොණරාගල දිස්ත්‍රික්කය - බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2013 වර්ෂය

2013 ජනවාරි මස 01 වැනි දින සිට 2013 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ පූර්ණ වරප්‍රසාදය මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත් ව 2012 අගෝස්තු මස 28 වැනි දින පෙ. ව. 10.30 දක්වා ම විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. මෙම රේන්දය නැවත විකිණීම 2012 ඔක්තෝබර් මස 22 වැනි දින පෙ.ව. 10.30 ට සිදු වේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අයට ටෙන්ඩර්පත් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි ය. නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර, මෙහි පහත ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කුවිතාන්සියක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුණේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් ඉල්ලුම් කරන ලද තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර්පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. එමෙන් ම ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතු වේ.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්වල කරන ලද සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන්ගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් විවෘත කරන දිනය වන 2012 අගෝස්තු මස 28 වැනි දින පෙ. ව. 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන්ට මෙම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය හැක. ටෙන්ඩර්පත් නිකුත් කිරීම 2012 අගෝස්තු 28 වැනි දින පෙ. ව. 10.30 ට අවසන් වේ.

05. යම්කිසි කරුණක් සටහන් නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කරන ලද දිනය, එනම් රේන්ද විකුණූ දින ප. ව. 2.00 ට පෙර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මාස දෙකක රේන්ද මුදල් කොටසකට නොවැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ආර්. එම්. ජේ. සී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
බඩල්කුඹුර.

2012 ජූලි මස 09 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*

*2013 වර්ෂය සඳහා අනුමත රා තැබෑරුම් ලැයිස්තුව - මොණරාගල දිස්ත්‍රික්කය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ග්‍රාමය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| 01. | මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පල්ලේවරාදොල | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා නැවත ප. ව. 4.00 සිට ප. ව. 8.00 දක්වා | 500.00 | 2012.08.28 දින පෙ. ව. 10.30 දක්වා |

08-11

---

**නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - 2013 වර්ෂය**

2013 ජනවාරි මස 01 වැනි දින සිට 2013 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට යටත්ව 2012 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 10.30 දක්වා නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිළදී ගැනීම සඳහා ඉදිරිපත්වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය ද, ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි මුදුණේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් නාරම්මල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහා ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2012 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාරම්මල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාදය මිලදීගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප.ව. 3.00 ට පෙර නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

07. 2013 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2013 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව, ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ද ලබාගත යුතුය.

08. 2012 සැප්තැම්බර් මස 03 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2012 ඔක්තෝබර් මස 25 වැනි දින පෙ.ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. ඒ. ආර්. සුදර්ශණී,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2012 ජූලි මස 17 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල මුදල රු. | රා තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වැසිය යුතු වේලාව |
|---|---|---|---|---|---|
| 01 | නාරම්මල | 2012.09.03 පෙ.ව. 10.30 ට පෙර | 1,000 | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 |

08-126

---

**2013 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්දය විකිණීම**

2013 ජනවාරි 01 වැනි දින සිට 2013 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිළ දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2012.08.27 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන රා තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් බාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය වන 2012.08.27 දින පෙ.ව. 10.30 ට සියලු ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2012.10.19 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකුල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකිණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2010 ජූලි මස 16 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*2013 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තු - ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2013.01.01 දින සිට 2013.12.31 දින දක්වා*

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටු වියයුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගල අංක 02 | ලුණුගල | ලුණුගල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස අංක 02 හි වරිපනම් අංක 219 දරන කුරුවිකුඹුර වත්ත | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රුපියල් 5,000 | 2012.08.27 පෙ.ව. 10.30 |

මහදෝව වත්තේ සීමාව තුළ 2013 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍ර අලුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2012.08.27 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතුය.

08 -97

---

# රජයේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2011 සැප්තැම්බර් මස 01 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : එස් පී එම් කෝපරේට් එකවුන්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 81006
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 1043 බී, මරදාන පාර, බොරැල්ල.

සමාගම් ලේකම්.

08-02

---

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : සිල්ක් රෝඩ් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී වී 86240
සංස්ථාගත කිරීමේ දිනය : 2012 මැයි 29
ලියාපදිංචි කාර්යාලය : අංක 38 ඒ, ඉහළගම, ගම්පහ.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

08-09/1

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : හොටෙල් බිල්ස් එල්කේ (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී වී 86458
සංස්ථාගත කිරීමේ දිනය : 2012 ජුනි 11
ලියාපදිංචි කාර්යාලය : අංක 4, ඩිවොස් ඇවනියු, කොළඹ 04.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

08-09/2

---

## සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම එහි (මුල්) නාමය වෙනස් කොට ඇති අතර (8 වැනි වගන්තියට අනුකූලව) එය 2012 ජුනි මස 11 වැනි දින සිට බලපවත්වනු ලබන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ කලින් (මුල්) නාමය : සවුත් වෙස්ට් එම්ප්ලෝයිමන්ට් බියුරෝ (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී වී 7978
සමාගමේ ලිපිනය : අංක 40/2, ලේක් ගාඩින්ස්, ශ්‍රී ජයවර්ධනපුර පාර, රාජගිරිය
සමාගමේ නව නාමය (අලුත් නම) : ඉන්ස්ටිටියුට් ඔෆ් හොටෙල් ඇන්ඩ් ට්‍රැවල් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

චාර්ට් බිස්නස් සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

08-09/3

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කරන ලදී.

සෙයිකෝ ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 09, නිමල් පාර, කොළඹ 04.
ලියාපදිංචි අංකය : පී වී 78776
සංස්ථාගත කළ දිනය : 2011.05.11.

08-06/1

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කරන ලදී.

අයිෆල් ටිම්බර් ස්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 400/3, ගල්කන්ද හන්දිය, කොළඹ පාර, මීගමුව
ලියාපදිංචි අංකය : පී වී 64116
සංස්ථාගත කළ දිනය : 2008.05.15

08-06/2

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : මැග්සෙ කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 72305
සංස්ථාගත කළ දිනය : 2010.05.13
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 140/ඩී, නැදගමුව, කොටුගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලය.

08-06/3

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සේලංකා ඉම්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 64994
සංස්ථාගත කළ දිනය : 2008.07.08
සමාගමේ ලියාපදිංචි ලිපිනය : තැ. පෙ. අංක 07, බෝතලේගම, බුලත්සිංහල.

අධ්‍යක්ෂ මණ්ඩලය.

08-06/4

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කරන ලදී.

ලංකා ග්‍රීන් වොලන්ටියර්ස් (ගැරන්ටි) සමාගම , අංක 09, නිමල් පාර, කොළඹ 04
ලියාපදිංචි අංකය : ජී එල් 2160
සංස්ථාගත කළ දිනය : 2011.08.30.

08-06/5

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කරන ලද බව මෙයින් දන්වමු.

සමාගමේ නම : රැඩිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 86810
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 498/8, බොරැල්ල පාර, පනාගොඩ, හෝමාගම
ලියාපදිංචි කළ දිනය : 2012.06.27

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

රැඩිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

08-05

---

### විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාතර, වල්ගම, ජ්ලවර් ගාඩින්ස් අංක 130/1/1 හි පදිංචි සුදුවා දේවගේ නාලක කුමාර (N. I. C. No. 792371965 V) වන මට මාතර ප්‍රසිද්ධ නොතාරිස් පියසිරි ජයරත්න මහතා විසින් ලියා සහතික කළ අංක 1260 සහ 2011.01.28 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රයක් කෝට්ටගොඩ, තලල්ල දකුණ, මිල්ලගහහේන හි පදිංචි චාමලී ශාන්ත කුමාරි ජයසුන්දර (ජා. හැ. අ. 805430931 වී) යන අය මාගේ ඇටර්නි බලකාරිය වශයෙන් පත් කරන ලද ඇටර්නි බලපත්‍රය වර්ෂ 2012.03.15 දින සිට අවලංගු වන බව සියලුම දෙනාට මින් දැනුම් දෙමි.

08-04

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන සමාගම 2011 දෙසැම්බර් මස 01 වැනි දින සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : යූ. එස්. ඉංජිනියරින් සර්විස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 82840
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 244, කඩුවෙල පාර, මාලබේ.

ලේකම්.

08-03

## ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම පිළිබඳ නිවේදනයයි

ලැක් ඇන්කෙ ජර්මනියේ විදේශ ගමන් බලපත්‍රය අංක CILTLVWP 6 හිමි ස්ථිර පදිංචිය ප්ලෙන්ස් බර්ගර් ස්ට්‍රාසෙ 324894 ටෝක් ජර්මනිය දැනට අංක 69/10, පරණ පාර, කළුතර දකුණ, ශ්‍රී ලංකාවේ පදිංචි මා මහජනතාව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට මෙයින් දන්වා සිටින්නේ මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කළුතර උතුර, කැලිඩෝ පාරේ, අංක 14/6, පදිංචි දමිත් සමන්තික මීගොඩ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් සේපාලගේ ප්‍රැන්සිස් පෙරේරා විසින් සහතික කරන ලද 2012.04.19 වැනි දින සහ අංක 1497 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් පත් කර තිබුණ බවත් අද දින සිට බලපැවැත්වෙන පරිදි එම අසීමිත බලය සහිත ඇටර්නි බලපත්‍රය අහෝසි කර අවලංගු කර බලරහිත කළ බවයි. මා වෙනුවෙන් ඔහු කරන ඕනෑම ක්‍රියාවක් කරුණු කාරණාදිය වෙනුවෙන් මින් මතු මා වග නොකියන බව ද දන්වා සිටිමි.

08-39

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : රෙස්පෙක්ට් ඉන්ටිග්‍රේටඩ් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 86925
ලියාපදිංචි ලිපිනය : අංක 272/4, හයිලෙවල් පාර, කොළඹ 05
සංස්ථාගත කළ දිනය : 2012 ජූලි මස 09 වැනි දින

රෙස්පෙක්ට් ඉන්ටිග්‍රේටඩ් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

08-115

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2012 ජූලි මස 09 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : කළම්බු රැපිඩ් ට්‍රාන්සිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 86922
ලියාපදිංචි කාර්යාලය : 4 වැනි මහල, අංක 2, කාසල් පටුමග, කොළඹ 04

එසජේ කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

2012 ජූලි මස 18 වැනි දින,
04 වැනි මහල,
අංක 02, කාසල් පටුමග,
කොළඹ 04.

08-140

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : පිලපිටිය ආයුර්වේද ඇන්ඩ් හර්බල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 86454
සංස්ථාගත කළ දිනය : 2012 ජූනි මස 11 වැනි දින
ලියාපදිංචි ලිපිනය : "පිලපිටිය වෙද මැදුර" කැස්බෑව, පිළියන්දල.

අධ්‍යක්ෂ.

08-139

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ නිවේදනය.

සමාගමේ නම : කැෆේ ෆිෆ්ටිෆයුව් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 84467
ලියාපදිංචි කළ දිනය : 2012 පෙබරවාරි මස 27 වැනි දින
කාර්යාලය : අංක 9/2, සෝවිස් මාවත, කල් එළිය, ජාඇල.

අධ්‍යක්ෂ.

08-137

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තියට අනුව දැන්වීමයි

සමාගමේ නම : ජොයින් මෙට්ල් ක්‍රෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලි. ප. අංකය : පී වී 86315
ලියාපදිංචි කළ දිනය : 2012 ජූනි මස 01 වැනි දින
සමාගමේ ලිපිනය : අංක 31/11, 2 වැනි පටුමග, නාවල, රාජගිරිය.

අධ්‍යක්ෂ.

08-136

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : හර්සෙන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 66976
ලියාපදිංචි කළ දිනය : 2009.02.05
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : පෝරුවදණ්ඩ, හොරණ.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-131/1

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : ඇඩ්ලාන්ටිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 67171
ලියාපදිංචි කළ දිනය : 2009.03.02
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 116/8, ගාලු පාර, සරික්කාමුල්ල, මොරටුව.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-131/2

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සදා හරිත ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : පීවී 70137
ලියාපදිංචි කාර්යාලය : අංක 41, ධර්මපාල මාවත, කොළඹ 03
සංස්ථාගත කරන ලද දිනය : 2009 නොවැම්බර් මස 26 වැනි දින

ගන්ලත්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

ගලදාරි හෝටලය,
අංක 64, ලෝටස් පාර,
කොළඹ 01.

08-130

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම.

සමාගමේ නම : එඩික්සන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 81157
ලියාපදිංචි කළ දිනය : 2011 සැප්තැම්බර් මස 08 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 24, විද්‍යාලයම් වීදිය, ත්‍රිකුණාමලය.

සමාගම් ලේකම්.

08-129

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම.

සමාගමේ නම : ඩේවිඩ්සන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 82993
ලියාපදිංචි කළ දිනය : 2011 දෙසැම්බර් මස 08 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 304/4 සෙන්ට්‍රල් පාර, ත්‍රිකුණාමලය.

සමාගම් ලේකම්.

08-128

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

නුගේගොඩ, උඩහමුල්ල, පරණ කොට්ටාව පාර අංක 7/1 හි පදිංචි හැඳුනුම්පත් අංක 500690283 V හිමි කංකානම්ගේ වෝල්ටර් කුලතුංග වන මා ඩබ්. එන්. අභයරත්න නොතාරිස් සහතික කළ අංක 606 සහ 1992.09.06 දිනැති ඇටෝර්නි බලපත්‍රය මත වඩුගේ ශ්‍යාමා දමයන්ති කුලතුංග වෙත ලබා දුන් ඇටෝර්නි බලය අවලංගු කරනු ලබන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

08-127

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

| *සමාගමේ නම* | *සමාගම් අංකය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* | *සංස්ථාපිත කළ දිනය* |
|---|---|---|---|
| කේන් කෝපරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී | පීවී 79284 | අංක 1, සුලේමාන් ටෙරස්, කොළඹ 05 | 2011 ජූලි 8 |
| සීපෘටිස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 84010 | අංක 1, සුලේමාන් ටෙරස්, කොළඹ 05 | 2012 පෙබරවාරි 01 |
| මියුනෙක්ස් ග්‍රීන් එනජි (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 82147 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 05 | 2011 ඔක්තෝබර් 27 |
| මියුනෙක්ස් නාහල්වතුර හයිඩ්‍රොපවර් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 84216 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 05 | 2012 පෙබරවාරි 14 |
| සිටි ලෑන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 84351 | අංක 1, සුලේමාන් ටෙරස්, කොළඹ 05 | 2012 පෙබරවාරි 07 |
| මිෂෙල් ටෙම්පොන්ග්කො ජොන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 85074 | අංක 1, සුලේමාන් ටෙරස්, කොළඹ 05 | 2012 මාර්තු 22 |
| ඒ. කේ. ජී. ඉවෙන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 85968 | අංක 71, ග්‍රීන් පාත්, කොළඹ 7 | 2012 මැයි 15 |
| මියුනෙක්ස් නාහල්වතුර හයිඩ්‍රොපවර් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 86204 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 05 | 2012 මැයි 28 |

සමාගම් ලේකම්.

08-147

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

රාජගිරිය, මහජන රාජාරාමයෙහි වැඩවාසය කරන පූජ්‍ය මාවඩවිල පඤ්ඤාසේන හිමියන් වන මම සියලුම දෙනාට දැනගැනීම පිණිස හෙළිදරව් කරන වගනම්, ප්‍රසිද්ධ නොතාරිස් රාජිකා රණතුංග විසින් 2011 දෙසැම්බර් මස 17 වැනි දින ලියා සහතික කරන ලද අංක 6 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් උඩුනුවර වේගිරිකන්ද ජාත්‍යන්තර භාවනි බෞද්ධ මධ්‍යස්ථානයෙ හි වැඩවාසය කරන පූජ්‍ය පොල්පිටියේ කාශ්‍යප හිමියන් වෙත මා විසින් දෙන ලද ඇටෝර්නි බලය 2012 ජූලි මස 18 වැනි දින සිට අවලංගු කරන ලද අතර එම දිනෙන් පසුව ඔහු විසින් එළඹෙන කිසිදු කටයුත්තකට මා වග නොකියන බවත් මෙයින් දන්වා සිටිමි.

පූජ්‍ය මාවඩවිල පඤ්ඤාසේන හිමි.

මහජන රාජාරාමය,
රාජගිරිය.

08-91

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රත්මලාන, 3 වැනි පටුමග, අංක 49 දැනට කොළඹ 6, වැල්ලවත්ත, නෙල්සන් පෙදෙස, අංක 22 හි පදිංචි මොහොමඩ් ෆස්රි රම්සි වන මා විසින් රත්මලාන, 3 වැනි පටුමග, අංක 49 දැනට කොළඹ 6, වැල්ලවත්ත නෙල්සන් පෙදෙස, අංක 22 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් ෆිර්සාන් රම්සි යන අය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන මොහොමඩ් සබ්රි නිලාමුඩීන් මහතා විසින් 2006.01.24 වැනි දින හා අංක 772 යටතේ ලියා සහතික කරන ලද හා කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටොර්නි බලපත්‍ර ලේඛනයේ 339 වැනි කාණ්ඩය 111 වැනි පත් ඉරුවේ දිනපොත් අංක 12319 යටතේ 2006.09.22 වැනි දින දී ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය බල රහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර, මින් පසුව ඇය විසින් සිදුකරනු ලබන කිසිම ක්‍රියාවකට, බලයකට, ඔප්පුවකට හෝ කරුණකට ඇය වෙනුවෙන් මා වග නොකියන බව ද උතුම් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයටත් මහජනයාටත් මෙයින් දන්වා සිමිටි.

මොහොමඩ් ෆස්රි රම්සි.

08-89

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 :1 වගන්තිය අනුව දනුම්දීමයි

සමාගමේ නම : ගෙමොනොයිඩ් මීඩියා ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : 'පී වී 86959'
ලියාපදිංචි ලිපිනය : අංක 329/1, නාවල පාර, නාවල
ලියාපදිංචි දිනය : 2012.07.10

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

08-87

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඇල්පිටිය, 09 කණුව පිංළිඳ පාරේ පදිංචි හේවා හකුරු යමුනා රාණි (විවාහයට පසු යමුනා ඒකනායක) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් හේමපාල සිල්වා මයා ලියා සහතික කළ අංක 1117 සහ වර්ෂ 2001 ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දිනැති ඇටර්නි බලපත්‍රය මගින් කරන්දෙණිය, කිරිජේද්ද, දංඅත්ත, අංක 112/2 හි පදිංචි හේවා හකුරු රසික නිරෝෂන් කුමාර යන අයට පවරා තිබූ ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

08-86

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය.

සමාගමේ නම : ඇසිස්ටන්ස් ෆැක්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 86667
ලිපිනය : අංක 369/1 ඊ, 4 වැනි පටුමග, නන්දසාර මාවත, හෝකන්දර උතුර
සංස්ථාගත කළ දිනය : 2012.06.20.

අධ්‍යක්ෂ.

08-84

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීමේ දැන්වීම

වේයන්ගොඩ, එස්සැල්ල, පිටවෙල, මැටිකොටමුල්ලලේ අංක 144/A හි පදිංචි කලුදේව රසිකා දිල්රුක්ෂි වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් දයාරත්න රාජපක්ෂ මහතා විසින් ලියා සහතික කරනලද අංක 19828 හා 2009.07.23 වැනි දිනැති ඇටෝර්නි බලපත්‍රය මත එස්සැල්ල, පිටවෙල, මැටිකොටමුල්ලලේ අංක 145/A හි පදිංචි කලුදේව ඉරේසිකා ලක්මාලි යන අය වෙත පවරා තිබූ ඇටෝර්නි බලතල මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බව සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස දන්වා සිටිමි. එකී ඇටෝර්නි බලපත්‍රය මත මින් ඉදිරියට මා වෙනුවෙන් ඇය විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බව ප්‍රකාශ කරමි.

කලුදේව රසිකා දිල්රුක්ෂි.

08-81

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාවට දන්වා සිටින වග නම් :- මීගමුව, ඒත්තුකාල ශාන්ත සෙබස්තියන් පෙදෙස, අංක 01 හි පදිංචි මේරි ඇන් ඉරාස්මි වන මා මීගමුව. ඒත්තුකාල, රාණි මාවත, අංක 63 හි පදිංචි වික්‍රමරත්න විදානලාගේ ප්ලැයිඩස් ප්‍රනාන්දුට බලය දුන් ජයනි පෙරේරා ප්‍ර : නො. ගේ අංක : 3309 සහ 2007.03.22 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරමි. මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය මත ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බවට මෙයින් දැනුම් දෙමි.

08-108

## ඇටෝර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජාවාදී ජනරජයේ ආණමඩුව, මිල්ලගස්යාය හි පදිංචි වීරසිංහ ආරච්චිලාගේ ලිනා වීරසිංහ වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එච්. එම්. නලින් චන්දන අබේරත්න මහතා විසින් වර්ෂ 2011.01.11 දින ලියා සහතික කරන ලද අංක 3355 දරන ඇටෝර්නි බලපත්‍රය මඟින් මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් අංක 1, හලාවත පාර, ආණමඩුව දරන ස්ථානයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ සුමිත්‍රා රත්නායක පත්කර තිබූ ඇටෝර්නි බලය 2012.07.12 වැනි දින පටන් මින් අවලංගු කරන්නෙමි. එබැවින් එදින පටන් එකී ඇටෝර්නි බලකරු විසින් කරන කිසිම කටයුත්තකට වීරසිංහ ආරච්චිලාගේ ලිනා වීරසිංහ වන මම වග නොකියන බව මෙයින් සියලු දෙනාට ම දැනුම් දෙමි.

වීරසිංහ ආරච්චිලාගේ ලිනා වීරසිංහ.

08-74

---

## ඇටෝර්නි බලපත්‍රයෙන් මා දුන් බලය අවලංගු කිරීමයි

අළුත්ගම, දර්ගා නගරය, අලවියා පාර, අංක 121/5 හි පදිංචි මොහොමඩ් ෂෙරිප් මොහොමඩ් සැකි හුසේන් ජා. හැ. අංක 582750572 V වන මා සහ පානදුර, තොටවත්ත, ඉබ්‍රාහිම් පාර, අංක 11/13 හි පදිංචි මොහොමඩ් ෂෙරිප් සිත්ති සරීනා වන අපගේ ඇටර්නි බලකරු ලෙස පානදුර, හේනමුල්ල, වත්තල්පොල පාර, ජම්බුගස්මුල්ල අංක 63/23 හි පදිංචි යුසුෆ් මොහිදීන් මොහොමඩ් නියාස් යන අය පත් කරමින් පානදුර, සුසන්ත මාවත, ඩයස් ගොඩනැගිල්ල හි පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් එම්. ටී. එම්. බාෂීක් මහතාගේ අංක 11268 සහ 2012.03.01 දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් අප විසින් දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. එය මත මින් ඉදිරියට අප වෙනුවෙන් ඔහු විසින් කරන ලද කිසිදු කටයුත්තකට අප වග නොකියන බව ප්‍රකාශ කරමු.

මොහොමඩ් ෂෙරිප් මොහොමඩ් සැකි හුසේන්,
මොහොමඩ් ෂෙරිප් සිත්ති සරීනා.

08-73

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සිලියන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 86554
ලියාපදිංචි කළ දිනය : 2012 ජූනි 14 වැනිදා
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 20/6ඒ, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

08-56

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගතකොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ජනහිත රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83454
ලියාපදිංචි කාර්යාලය : අංක 107/1, මාකොළ දකුණ, මාකොළ
ලියාපදිංචි දිනය : 2012.01.02

සමාගමේ අධ්‍යක්ෂකවරු.

08-100

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ප්‍රිමියර් නැචුරල් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 85591
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 19, විපුලසේන මාවත, කොළඹ 10.

08-163

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම්දීමයි.

සමාගම් නාමය : කලම්බු ඩිසයින් ස්ටුඩියෝ
සමාගම් අංකය : පී වී 86380
සමාගම් ලිපිනය : අංක 03, සුලෙයිමාන් ටෙරස්, (ජාවත්ත පාරෙන් හැරී) කොළඹ 05
සමාගම් ලේකම් : මැනේජර්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම, අංක 08, ටිකල් පාර, කොළඹ 08.
ලියාපදිංචි කළ දිනය : 2012 ජුනි 06.

08-162

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරන දැන්වීමයි

සමාගම් නාමය : සොෆ්ට් ලොජික් කමියුනිකේෂන් සර්විසස් පුද්ගලික සමාගම
ලියාපදිංචි අංකය : පී වී 69212
ලියාපදිංචි කාර්යාලය : අංක 14, ද ෆොන්සේකා පෙදෙස, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලය.

08-171

**ප්‍රසිද්ධ දැන්වීමයි**

ආසිරි හොස්පිට්ල් මාතර (ප්‍රයිවට්) ලිමිටඩ්

(සමාගම් ලියාපදිංචි අංකය : පීවී 13306)

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව මාතර මෙඩි හවුස් (ප්‍රයිවට්), (සමාගම් ලියාපදිංචි අංකය : පී වී 2679) සමාගම, ආසිරි හොස්පිට්ල් මාතර (ප්‍රයිවට්) ලිමිටඩ්,) සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 13306) සමාගම හා යෝජිත ඒකාබද්ධ කිරීම පිළිබඳව, එම සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව කෙරෙනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි.

මාතර මෙඩි හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, ආසිරි හොස්පිට්ල් මාතර (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම හා යෝජිත ඒකාබද්ධ කිරීම පිළිබඳව, 2011 ඔක්තෝබර් 27 වැනි දින, කොළඹ හා මාතර ප්‍රදේශවල බෙදා හරින ලද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි දිනපතා පුවත්පත්වල සහ 2012 ජනවාරි මස 27 දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම් ප්‍රකාරව එම ඒකාබද්ධ කිරීම් කටයුතු දැන් සම්පූර්ණ කොට ඇති බවත්, ඒ අනුව, මෙම ඒකාබද්ධ කිරීම, ඒකාබද්ධ කිරීමේ සහතිකයේ සඳහන් දිනය වන 2012 ජුනි මස 22 වැනි දින සිට බලාත්මක වන බවත්, මෙම නිවේදනය මගින් තවදුරටත් දක්වා සිටිනු ලැබේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

ආසිරි හොස්පිට්ල් මාතර (ප්‍රයිවට්) ලිමිටඩ්,
(අත්සන් කළේ) සොෆ්ට් ලොජික් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2012 ජූලි මස 09 වැනි දින.
අංක 14, ද ෆොන්සේකා පෙදෙස,
කොළඹ 05.

08-170

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ නිවේදනයයි**

බුලත්කොහුපිටිය පදිංචි මලල්පොල ලේකම්ලාගේ කුමාරි විවාහයෙන් පසු ප්‍රනාන්දු වන මා විසින් රුවන්වැල්ල, වැන්දල, පහළමුල්ල පාර, අංක 116 හි පදිංචි මලල්පොල ලේකමලාගේ චන්ද්‍රිකා හේමාංගනී මලල්පොල යන අය මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් පත්කරමින් මහනුවර අධිකරණ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. සුසිල් හේරත් මහතා විසින් වර්ෂ 2007 ක් වූ අගෝස්තු මස 22 වැනි දින ලියා සහතික කළ අංක 1115 දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2012 ක් වූ ජූලි මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලද බවත්, එදිනෙන් පසු එකී මාගේ ඇටෝර්නි බලකාරයා විසින් එකී ඇටෝර්නි බලපත්‍රය උපයෝගී කර ගනිමින් මා නමින් හා මා වෙනුවෙන් කෙරෙන කිසිදු කාර්යයකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට හා පොදු මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

එම්. එල්. කුමාරි විවාහයෙන් පසු ප්‍රනාන්දු.

08-202

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි

සමාගමේ නාමය : ග්‍රීන් ලංකා ප්ලාන්ටේෂන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 86300
ලියාපදිංචි කළ දිනය : 2012.06.01
කාර්යාල ලිපිනය : අංක A 41/5, කෝපිවත්ත පාර, මොලමුරේ මාවත, කෑගල්ල.

ලේකම්.

07-323

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් තැබෑරුම**

**2013 වර්ෂය සඳහා වූ රේන්ද විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගු සෑම සුරා බදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරා බදු කොන්දේසිවලටත් මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයන් මිල දී ගැනීම සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම්/අතිරේක දිසාපති තැන වන මා විසින් 2012.08.22 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම ලබාගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

03. ටෙන්ඩර් සහ වත්කම් සහතිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු ය :-

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සාක්ෂිකරුගේ අත්සන යොදා තිබිය යුතු ය ;

(iii) සෑම වෙනසක් කිරීමක් හෝ වචන කපා හැරීමක් වෙනුවෙන් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙකී අවශ්‍යතාවයන්ට පටහැනිව ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04.විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය -

*(අ)* ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ කුවිතාන්සිය,
*(ආ)* වත්කම් සහතිකය.

සමග ලියුම් කවරයක බහා සීල් තබා ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි ඉහළින් තැබෑරුම් අංක සහ නම සඳහන් කර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතු ය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම දෙල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව ඉහත සඳහන් පළවන ඡේදයේ සඳහන්කර ඇත. එකී වේලාවන්වල දී සියලුම ටෙන්ඩර්කරුවන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසු ප.ව. 2.30 ට පෙර දෙල්තොට ප්‍රාදේශීය ලේකම්තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප මුදලක් වශයෙන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පතක් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතක් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

07. සියලුම මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රලත් ස්ථානවල විකිණීම සඳහා තොග (පීප්ප) අරක්කු නිකුත් නොකරන ලද බව සැලකිය යුතුය.

08. මෙම විදේශ මත්පැන්හල දැනට පවත්වාගෙන යන ස්ථානයේම පවත්වාගෙන යෑමට අනුමැතිය දෙනු නොලැබේ. ගැටළු නොමැති සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට කටයුතු කිරීම රේන්දකරුගේ වගකීමක් වන්නේ ය.

09. ආරක්ෂිත හේතුවක් මත හෝ රජය මගින් නිකුත් කරනු ලබන හෝ වෙනයම් කරුණක් මත හෝ විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තබන කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. මීට පෙර විදේශ මත්පැන් සලක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් රජයට යම් මුදලක් ගෙවීමට තිබේනම් ටෙන්ඩරය පිළිගැනීමට ප්‍රථම එම හිඟ මුදල ගෙවා නිම කළ යුතුය.

11. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

ටී. ගාමිණී මුණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2012 ජූලි මස 13 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කළ විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව - 2013 වර්ෂය**

| *අනුක්‍රමික අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම විවෘත කර තබන කාලය සහ වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|
| විදේශ මත්පැන්හල | දෙල්තොට | දෙල්තොට කරගස්කඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2012.08.22 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 1,000 ක් වේ.

08-118

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - මිනුවන්ගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල සීමාවේ, මාපොතල උප කාර්යාලයේ අස්සැන්න වත්ත ගමේ පිහිටි කහටගහලන්ද නමැති ඉඩමේ පර්චස් දහයයි දශම දෙක (අ. 0 රූ. 0 පර්. 10.2) ක් විශාල බිම් කොටස.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2012.08.28 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා රජයේ *ගැසට් පත්‍රයේ* 2009.12.24 වැනි දින ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2010.12.01 වැනි දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මිනුවන්ගොඩ සිට මිනුවන්ගොඩ දිවුලපිටිය පාරේ කි. මී. 6.75ක් ගිය විට පාරේ වම්පස අඩි 10ක් පළල පාර හමුවේ. එහි මීටර් 100ක් පමණ ගිය විට පාරේ දකුණු පස සුරුකුම් දේපළ හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමඟ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක. ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033-2222325, 033-2225008, 033-2231901,

ෆැක්ස් අංකය : 033-2226165, 033-2226741.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, මුළු දිවයිනටම සාම විනිසුරු.

*කාර්යාලය* : අංක 25 "බී" බෙල්මන්ට් වීදිය, කොළඹ 12,
දුරකථන අංක : 011-5756356, 071-8760986,
ෆැක්ස් අංකය : 011-2334808,
නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංකය : 011-2419126.

08-152

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

අයි. ජී. ආර්. සී. රොෂාන්
ගිණුම් අංක : 1057 5314 7084

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල

ප්‍රකාර 2010 මාර්තු මස 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් ලක්ෂ තිස් තුන් දහස් තුන්සිය තිස් නමයයි ශත විසි පහක (රු. 333,339.25) මුදල ද, 2010 ජනවාරි මස 13 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ දහ නම දහස් පන්සිය විසි හයයි ශත හැට පහක (රු. 319,526.65) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.07.09 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2010.06.22 දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2012.08.28 වැනි දින පෙ. ව. 9.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (පෝරුවදණ්ඩ උප කාර්යාලය) හඳපාන්ගොඩ ග්‍රාමයේ පිහිටි "කැකුණගහවත්ත (කොටසක්) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. ඒ. පී. ජයසූරිය යන අය විසින් සාදන ලද 2006 අගෝස්තු මස 07 දාතම හා අංක 4099 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 24 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් බී (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම) නැගෙනහිරට : ඉංගිරියේ සිට පාදුක්ක දක්වා ප්‍රධාන පාර දකුණට : ලියනගේ චාර්ලිස් යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 23 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4099 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 174/142 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ලොට් 24 වශයෙන් ලකුණු කොට ඇති ඉහත කී ඉඩම් කොටස පහතින් විස්තරකොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී හඳපාන්ගොඩ ග්‍රාමයේ පිහිටි "කුකැණගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ජේ. නානායක්කාර යන අය විසින් සාදන ලද 1972 නොවැම්බර් 03 දාතම හා අංක 1679 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 24 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් බී (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම) නැගෙනහිරට : ඉංගිරියේ සිට පාදුක්ක දක්වා ප්‍රධාන පාර දකුණට : ලියනගේ චාර්ල්ස් යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 23 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුද්ධයන් ද සමග එකී අංක 1679 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඊ 86/155 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

08-169

---

### සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 162 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාවට අයත්, අංක 28, සගබෝ මාවත යන ලිපිනය දරන ලේඩි කැතරින් ගෘෘප් ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු එස්. ජේ. ජයවික්‍රම විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 05 වැනි දිනැති අංක 2177 දරන පිඹුරේ ලොට් අංක 62 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 20

අංක 111 දරන පිඹුරේ ලොට් අංක 153 ලෙස දැක්වෙන බිම් කට්ටිය හරහා වැටී ඇති මාර්ග අයිතිය ද සහිතව.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. නන්දනී විසින් සහතික කරන ලද, 2009 අගෝස්තු මස 26 වැනි දිනැති අංක 162 දරන උකස්කරය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නීතිගත වූ සහ එහි ලියාපදිංචි කාර්යාලය රත්මලාන පිහිටි රන්මාර්ට් පැකේජින්ග් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ.

සීමාසහිත ඩී එෆ් සී සි වර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2012 අගෝස්තු මස 24 වැනි දින (සිකුරාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* – මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2 % ක (සියයට දෙකහමාර),
4. රු. 68,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී. එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක 011-2440366/77.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි."

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1982.com.

වෙබ් අඩවිය :www.sandslanka.com

08-77

---

**සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1355 සහ 151 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාවට අයත්, අංක 28, සගබෝ මාවත යන ලිපිනය දරන ලේඩි කැතරින් ගෘෆ් ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු එස්. ජේ. ජයවික්‍රම විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 05 වැනි දිනැති අංක 2177 දරන පිඹුරේ ලොට් අංක 62 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 20.

අංක 111 දරන පිඹුරේ ලොට් අංක 153 ලෙස දැක්වෙන බිම් කට්ටිය හරහා වැටී ඇති මාර්ග අයිතිය ද සහිතව.

**අංක 156 සහ 163 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ. මොරටුව නගර සභා සීමාවට අයත්, අංක 18, තෙලවල පිහිටි ලේඩි කැතරින් ගෘෆ් ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල් ද සිල්වා විසින් සාදන ලද, 1984 ජූලි මස 12 වැනි දිනැති අංක 4056 දරන පිඹුරේ ලොට් අංක 195 ඒ ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය සහ එහි පිහිටි ගස්වැල්, වගාවන් පස ආදි සියල්ල.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 10.

අංක 111 දරන පිඹුරේ ලොට් අංක 205 ලෙස දැක්වෙන බිම් කට්ටිය හරහා වැටී ඇති මාර්ග අයිතිය ද සහිතව.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. වීරසිංහ විසින් සහතික කරන ද 2007 මාර්තු මස 16 වැනි දිනැති අංක 1355 දරන කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. නන්දනී විසින් සහතික කරන ලද 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 151, 2009 අප්‍රේල් මස 20 දිනැති අංක 156, 2009 අගෝස්තු මස 26 දිනැති අංක 163 දරන උකස්කරයන් ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නීතිගත වූ ලියාපදිංචි අංක පීවී 5864 දරන සහ ලියාපදිංචි කාර්යාලය රත්මලාන පිහිටි රන්වන් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පෙරොන්දු නිසියාකාර ඉෂ්ඨ නොකරන ලද දේපළ.

සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2012 අගෝස්තු මස 24 වැනි දින (සිකුරාදා) පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2 % ක (සියයට දෙකහමාර) ;
4. රු. 68,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500 ;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී. එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2440366/77.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි."

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය :011-2588176,
ඊ මේල් :schokman@samera1982.com.

වෙබ් අඩවිය :www.sandslanka.com

08-78

## සෙලාන් බැංකුව පීඑල්සී - තිස්සමහාරාම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ වීරවිල පදිංචි කොකු හැන්නදිගේ සරත් ගාමිණී අබේසූරිය යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ වීරවිල පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 1996.06.03 වැනි දිනැති අංක 5030 දරන සැලැස්මේ සඳහන පුහුල්පෝරුව ලොට් 15 වයි 1 නමැති ඉඩමේ ලොට් ඒ සහ බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස රූඩ් දෙකයි පර්චස් හතක් (අ. 0, රූ. 2, පර්. 7) ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ බෙදා වෙන් කරන ලද කොටසක් වේ.

පෙර කී වීරවිල පිහිටි මිනුම්පති විසින් සාදන ලද අයිඑස්පීපී 01 හි සඳහන් සහ ඔහු භාරයේ තබා ඇති පුහුල්පෝරුව නමැති ඉඩමේ ලොට් 15 වයි 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස අක්කර එකයි පර්චස් දොළහක් (අ. 1, රූ. 0, පර්. 12) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2012 අගෝස්තු මස 24 වැනි දින පස්වරු 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - දෙබරවැව ඔරලෝසු කණුව මංසන්ධියේ සිට වීරවිල පාර ඔස්සේ කි. මී. 3ක් පමණ ගොස් පන්නෙගමුව මංසන්ධියට පැමිණ එම මාර්ගයේ ම තවත් කි. මී. 1.5ක් පමණ ගිය විට මාර්ගයේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම* .- රජයේ ගැසට් පත්‍රයේ 2012.04.27 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2012.05.21 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2012.05.04 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසි කරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමටත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456458, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.

08-107

---

## මහජන බැංකුව - ගිරිඋල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණිය හත්පත්තුවේ, උඩුකහ බස්නාහිර කෝරළේ මහරගම ගමේ පිහිටි "සිරිගලවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට අවසරලත් මානක සුමනරත්න බී. අබේකෝන් මහතා විසින් 2005 වසරේ සැප්තැම්බර් මස 08 වැනි දින මැන සාදන ලද අංක 8396 දරන පිඹුරේ සඳහන් ඉඩම් කැබැල්ල.

විශාලත්වය : අක්. 01, රූඩ් 0, පර්. 06)
විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලුදේත්.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ එකී ඉඩම 2012.09.04 වැනි දින ප. ව. 2.00 ට පිහිටි ස්ථානයේ දී අප විසින් වෙන්දේසියේ විකුණනු ලැබේ.

දිනමිණ පුවත්පතේ 2010.06.14 දී ද, ඩේලි නිව්ස් පුවත්පතේ 2010.06.14 දී ද, තිනකරන් පුවත්පතේ 2010.06.14 දී ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - ගිරිඋල්ල නගරයේ සිට කුරුණෑගලට යන මාර්ගයේ කිලෝ මීටර් 02 ක පමණ දුර ප්‍රමාණයක් ගොස් 14 වැනි කිලෝ මීටර් කණුව පසුකර ගොස් (නාරම්මල දංකොටුව බී - 308 මහා මාර්ගයේ) සහ බෞද්ධ පන්සල පසුකර යන විට මෙම දේපළ මහා මාර්ගයේ වම් පැත්තේ "හිල් සයිඩ් ගාර්ඩන්" හෝටලයට හැරෙන්නට ප්‍රථම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසි අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ;
3. වෙන්දේසි කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක්) ;

4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් මත වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 03, වත්හිමි පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල් ආපසු නොගෙවීමටත් සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් හා වෙනත් අදාළ විස්තර පහත ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 03, වත්හිමි පාර, කුරුණෑගල.

දුරකථන අංක : 037-2220670, 037- 2222572, 037-2225400.
ෆැක්ස් අංකය : 037-2225400.

කිසිදු පෙර දැනුම්දීමකින් තොරව මෙකී වෙන්දේසිය අත්හිටුවීමටත්, කල්දැමීමටත් බලය බැංකුව සතු ය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
සිය වසරකට අධික කාලයක් ශ්‍රී ලංකාවේ
පිළිගත් පුරෝගාමී වරළත් වෙන්දේසිකරුවෝ
සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථනය අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 011-2585408,
දුරකථනය/ෆැක්ස් අංකය : 081- 2224371,
ඊ මේල් :schokman@samera1892.com.

08-198

---

### මහජන බැංකුව - නාරම්මල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණිය හත්පත්තුවේ, උඩුකහ උතුරු කෝරලේ දෙමටගහවෙල නමැති ගමේ පිහිටි "සේතුවා මහලියද්ද කුඹුර සහ අස්සැද්දුමේ කුඹුර" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට අවසරලත් මානක එච්. එම්. කරුණාරත්න මහතා විසින් 2004 වසරේ සැප්තැම්බර් මස 06 වැනි දින මැන සාදන ලද අංක 27199 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 01 දරන ඉඩම් කැබැල්ල.

විශාලත්වය : අක්. 0, රූඩ් 0, පර්. 20.9
විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදි සෑම සියලුදේත්.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ එකී ඉඩම 2012.09.04 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී අප විසින් වෙන්දේසියේ විකුණනු ලැබේ.

දිනමිණ පුවත්පතේ 2009.11.11 වැනි දින ද , ඩේලි නිව්ස් පුවත්පතේ 2009.11.11 වැනි දින ද, තිනකරන් පුවත් පතේ 2009.12.02 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - නාරම්මල ප්‍රධාන හන්දියෙන් (එනම් ප්‍රාදේශීය සභා කාර්යාලය පිහිටි) ගිරිඋල්ල පාර දිගේ කිලෝ මීටර් 1/4 පමණ ගොස් දකුණු පැත්තට ඇති තාර පාර දිගේ මධ්‍ය මහා විද්‍යාලයට යන පාරේ මීටර් 40ක් පමණ ගොස් දකුණට තවත් මීටර් 15ක් පමණ දුරක් යන විට මෙම දේපළ හමුවේ. මෙම දේපළ පාරේ දකුණු පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසි අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ;
3. වෙන්දේසි කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක්) ;
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක් ;
5. විකුණුම් වියදම් මත වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ;
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 03, වත්හිමි පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල් ආපසු නොගෙවීමටත් සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් හා වෙනත් අදාළ විස්තර පහත ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 03, වත්හිමි පාර, කුරුණෑගල.

දුරකථන අංක : 037-2220670, 037- 2222572, 037-2225400.
ෆැක්ස් අංකය : 037-2225400.

කිසිදු පෙර දැනුම්දීමකින් තොරව මෙකී වෙන්දේසිය අත්හිටුවීමටත්, කල්දැමීමටත් බලය බැංකුව සතු ය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
සිය වසරකට අධික කාලයක් ශ්‍රී ලංකාවේ
පිළිගත් පුරෝගාමී වරළත් වෙන්දේසිකරුවෝ
සහ තක්සේරු කරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථනය/ෆැක්ස් අංකය : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 011-2585408,
දුරකථනය/ෆැක්ස් අංකය : 081- 2224371,
ඊ මේල් :schokman@samera1892.com.

08-197

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත් බද වාණිජ මහාධිකරණයේ දී ය

කොළඹ 2, හයිඩ්පාක් කෝනර්, අංක 97 පෙර කොළඹ 1, ජනාධිපති මාවතේ, අංක 69, සෙලින්කෝ මන්දිරයේ 3 වැනි මහලේ පිහිටි සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම

*පැමිණිලිකරු*................................

එදිරිව

නඩු අංකය : HC/ Civil/216/10/MR

කොළඹ 6, වැල්ලවත්ත, 37 වැනි පටුමග, අංක 83 හි සීමාසහිත රොමා ප්‍රොපටි ඩිවලොපර්ස් (පුද්ගලික) සමාගම

සමාගම් ලේකම්වරයාගේ ලිපිනය :
මැන්සෙක් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
6 ඒ, ඩේසිවිලා මාවත, බම්බලපිටිය

*විත්තිකරු*.............................

(දැනට 91/4, හැම්ප්ඩන් පටුමග, ඩබ්. ඒ. ද සිල්වා මාවත)

ඉහත අංක දරන නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව ඉහත කී විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගම වෙත රුපියල් 2,30,31,412.30 මුදලක් හා රු. 1,22,16,,195.59 ක මුදලක් මත වර්ෂ 2010.03.26 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා මසකට 4% බැගින් පොලිය ද, එතැන් සිට තීන්දු ප්‍රකාශිත මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් සමස්ථ මුදල සඳහා නෛතික පොළිය ද, නඩු ගාස්තු ද, ඒ සඳහා තවදුරටත් පොළිය හා ගාස්තු ද අයකර ගැනීමට පැමිණිලිකරු හට ආඥාකර ඇති බැවින් එකී මුදල විත්තිකරුගෙන් අයකරගැනීම සඳහා මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, එකී ඉහත විස්තර කර ඇති දේපළට අයත් සියලුම අයිතිවාසිකම්, පරවශතා සහ අනුබද්ධිතයන් ද විත්තිකරුගේ කවර ආකාරයෙන් හෝ සියලු අයිතිවාසිකම්, හිමිකම්, බලපුලුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළ නිශ්චිතවම බැදී ඇති බව හා ඇස්කිසි කළ හැකි බව තීන්දු ප්‍රකාශ කරන ලද හෙයින් ද,

කොළඹ වාණිජ මහාධිකරණ නඩු තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2012ක් වූ අගෝස්තු මස 30 වැනි දින ප. ව. 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කොළඹ නගර සහා සීමාවේ, වැල්ලවත්ත, හැම්ප්ඩන් පටු මගේ වරිපනම් අංක 91/4 ගුරුන්නාන්සේලාගේ මාදන්ගහවත්ත හෙවත් කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. රාසප්පා විසින් වර්ෂ 1991 අප්‍රේල් මස 30 වැනි දින බෙදා වෙන් කර මැන සාදන ලද අංක 2989 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 3243 දරන කොටසට මායිම් ලෙස උතුරට : කැබලි අංක 2613 සහ 4 ද, නැගෙනහිරට : කැබලි අංක ඒ 2 ඩී ද, දකුණට : කැබලි අංක බී 1 (මාර්ගයට වෙන් කර ඇත) සහ බස්නාහිරට : කැබලි අංක ඒ 2 බී ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම හතයි නවයක් (අ. 0 රූ. 0 පර්. 16.79) හෝ හෙක්ටයාර් 0.0424 විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු වන සියලුම දේ ද සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 158/150 හි ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩමට වර්ෂ 1949 මාර්තු මස 27 වැනි දින බලයලත් මානක එච්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 297 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක බී 1 මාර්ග අයිතීන් ද ඇතුළත් ව වඩාත් විස්තරාත්මකව පහත දැක්වේ.

ඉහත සඳහන් වැල්ලවත්තේ හැම්ප්ඩන් පටු මගේ පිහිටි මාදන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. එස්. පෙරේරා විසින් වර්ෂ 1949 මාර්තු මස 27 වැනි දින බෙදා වෙන් කර මැන සාදන ලද අංක 297 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක බී 1 (මාර්ගයට වෙන් කර ඇත) දරන කොටසට මායිම් ලෙස, උතුරට : කැබලි අංක AA, A2B, A2C, A2D, A2E ද, නැගෙනහිරට : කැබලි අංක A2E, දකුණට කැබලි අංක C ද, බස්නාහිරට : හැම්ප්ඩන් පටු මග ද යන මෙකී මායිම්, තුළ පිහිටි පර්චස් විසිතුනයි දශම දෙකයි බිංදුවක් (අ. 0 රූ, 0 පර්. 23.20) විශාල ඉඩම සහ සියලුම මාර්ග අයිතීන් ද, සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක වැල්ල, 165/234 හි ලියාපදිංචි වී ඇත.

*ඉඩමට පිවිසීම.* - ගාලු පාරේ වැල්ලවත්තේ පිහිටි ඩබ්. ඒ. ද සිල්වා මාවතේ මද දුරක් ගිය විට දකුණත පැත්තේ හමු වන හැම්ප්ඩන් පටු මගේ මීටර් 375ක් පමණ ගමන් කොට වම් පැත්තට වන්නට ඇති පුද්ගලික පාරේ මීටර් 100ක් පමණ ගිය විට වරිපනම් අංක 91/4 දරන මහල් නිවාසය එම පාරට මුහුණ ලා හමු වේ. තවද, 120 බස් මාර්ගයේ හැව්ලොක් ටවුම සහ පාමංකඩ මාර්ගයෙන් දකුණු පැත්තට ඇති ඩබ්ලිව්. ඒ. ද සිල්වා මාවතෙන් හැම්ප්ඩන් පටු මගට වමට හැරී ඉහත සඳහන් කළ ආකාරයට ගමන් කිරීමෙන් ද මෙම දේපළට පහසුවෙන් ඇතුළු විය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 2.5% ;
2. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු රු. 4,000 ;
3. සියලුම ප්‍රචාරක වියදම් ;
4. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු ;
5. වෙන්දේසිකරුගේ ගමන් ගාස්තු ;
6. ලිපිකරු සහ සෝෂක ගාස්තු රු. 2,500 ;
7. ප්‍රාදේශිය සභා ගාස්තු වෙන්දේසි මුදලින් 1%.

ඉතිරි 75% ක මුදල දින 30ක් ඇතුළත දී කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

පියරත්න මුතුකුමාරණ,
තක්සේරුකරු, වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777378441 - 071 - 4424478.

කළමණාකරු (අයකිරීම්),
සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.
දුරකථන අංකය : 011-2580210.

08-174

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| අගෝස්තු | 2012.08.03 | සිකුරාදා | 2012.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.10 | සිකුරාදා | 2012.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.17 | සිකුරාදා | 2012.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.24 | සිකුරාදා | 2012.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.30 | බ්‍රහස්පතින්දා | 2012.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2012.09.07 | සිකුරාදා | 2012.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.14 | සිකුරාදා | 2012.08.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.09.21 | සිකුරාදා | 2012.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.28 | සිකුරාදා | 2012.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2012.10.05 | සිකුරාදා | 2012.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.12 | සිකුරාදා | 2012.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.19 | සිකුරාදා | 2012.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.25 | බ්‍රහස්පතින්දා | 2012.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.